# දේශපාලන ප්‍රචණ්ඩත්ව ක්‍රියා සඳහා යුක්තිය

**"මිනිසුන් යුක්තිය සෙවීමට තැත් දරන විට, ඔවුහු අයුක්තිය අත්දකිති."**

**"කරුණාකර අමතක කරන ලෙස අපට නොකියන්න. අපට එය කළ නොහැක. ඒ වෙනුවට කමා කරන්න කියන්න. අපට එය කළ හැක."**

වසර 2014 අප්‍රේල් මස සිට ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලය, කාන්තාවන් සහ සංවර්ධන සංසදයෙහි (FOKUS) මූල්‍ය සහාය ඇතිව, 'පශ්චාත් යුද සුවවීම: කාන්තා ප්‍රතිපත්ති ප්‍රකාශනයක්' යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරයි. එහි අරමුණ වන්නේ, ශ්‍රී ලංකා රජය විසින් මෙහෙයවන සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියට සහාය දැක්වීමයි. තවද එය කාන්තාවන්ගේ සම්පූර්ණත්වය ආරක්ෂා කිරීම තහවුරු කිරීමෙන් සහ සමාජයීය සහ දේශපාලනික ප්‍රතිසංස්කරණය තුළ ඔවුන්ගේ සහභාගිත්වය වැඩි කිරීමෙන් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයෙහි 1325 යෝජනාව ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කරයි.

මේ සඳහා ජාතික සාම මණ්ඩලය බිම් මට්ටමේ ප්‍රජාවන් තුළ සිටින ප්‍රබල ලෙස කොන්කිරීමට ලක්වූ කාන්තාවන් සමග සෘජුවම කටයුතු කර ඇත. යුද්ධයෙහි ප්‍රචණ්ඩත්වයෙන් වෙනස් පීඩනයන්ට මුහුණදුන් දිස්ත්‍රික්ක 9 ක් තුළව්‍යාපෘතිය වැඩ කරයි. එනම්, වවුනියාව, මන්නාරම, ත්‍රිකුණාමලය, අම්පාර, ගාල්ල, හම්බන්තොට, මහනුවර, නුවරඑළිය සහ පුත්තලම යන මේවා තුළය. අප වැඩ ඇරඹූදා පටන්, ප්‍රජා මූල සංවිධාන, ආගමික පූජ්‍ය පක්ෂය, ප්‍රජා නායකයින්, සහ ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරීන් වැනි අය සමග කටයුතු කරමින් මෙම දිස්ත්‍රික්කවල යුද්ධයෙන් බලපෑමට ලක්වූ ප්‍රජාවන් 900 ක් සමග සම්බන්ධතා ගොඩනගා ගෙන ඇත. අපි කොන් කිරීමට ලක්වූ කාන්තාවන් 200 කට වඩා අධික සංඛ්‍යාවක් සමග සෘජුවම වැඩ කර ඇත්තෙමු. මොවුන්ගෙන් බොහෝදෙනෙක් වැන්දඹුවන් සහ/හෝ ගෘහමූලික කාන්තාවන් වන බැවින්, පශ්චාත් යුද සන්දර්භය තුළ බැහැර කිරීමේ සුවිශේෂී ගැටළුවලට මුහුණදෙති. මෙම කාන්තාවන්ගෙන් 72 දෙනෙක් මෙම ව්‍යාපෘතියෙහි නායිකාවන් ලෙස මතුවී ඇත. ඔවුන්ගේ දිස්ත්‍රික්කවල කාන්තාවන් ප්‍රකාශ කරන අවශ්‍යතා නියෝජනය කරමින් මෙම කාන්තාවෝ ශ්‍රී ලංකාව තුළ යුක්තිය, සමානාත්මතාව සහ සංහිඳියාවෙහි වඩාත් නියෝජනාත්මක ක්‍රියාවලියක් තහවුරු කිරීම සඳහා, සාමූහික ක්‍රියාකාරිත්වයන් සංවිධානය කරමින් සුවකිරීමේ ක්‍රියාකාරිත්වයන්, උද්ඝෝෂණ, ප්‍රාදේශීය ප්‍රතිසංස්කරණ, උද්දේශන වේදිකා, සහ අධ්‍යාපන ප්‍රයත්නයන් හට මුලපිරීම් සිදුකර ඇත.

මෙම සංක්ෂිප්ත පත්‍රිකාව, දේශපාලන ප්‍රචණ්ඩත්වයට ලක්වූ බිම් මට්ටමෙහි වින්දිතයින් අතර යුක්තිය සෙවීම කෙරෙහි බලපාන ගැටළු පරීක්ෂා කරයි. තවද, ව්‍යාපෘතිය අතරතුර උගත් පාඩම් පාදක කරගෙන නිර්දේශ ඉදිරිපත් කරයි.

**ක්‍රමවේදය**

මෙම ව්‍යාපෘතියෙහි මූලික ක්‍රමවේදය වී ඇත්තේ දැනුවත් බවෙන් ක්‍රියාකාරිත්වය දක්වා, සුවවීමෙන් බල ගැන්වීම දක්වා, ස්ථිරව ඉදිරියට යාමට සහාය දීමය. සෑම දිස්ත්‍රික්කයකම, අපගේ ප්‍රාදේශීය හවුල්කරුවන් සමග ජාතික සාම මණ්ඩලය පහත දැක්වෙන ක්‍රියාකාරකම් කර ඇත.

1. සංක්‍රාන්තික යුක්තියෙහි ස්ත්‍රී පුරුෂ සමාභාවයේ මානයන් ගැන දිස්ත්‍රික්ක මට්ටමේ හැඩගැස්වීමේ වැඩසටහන්: යෝජිත සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණ සහ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 1325 යෝජනාව ගැන කාන්තාවන් සහ ප්‍රජා නායකයන් හට අධ්‍යාපනය ලබාදෙන ලදී. මෙහි අවසාන ප්‍රතිඵලය ලෙස, බිම් මට්ටමේ කාන්තාවන් ඔවුන්ගේ ප්‍රජාවන් තුළ සාමයට සහ යුක්තියට ඇති බාධක ගැන සාකච්ඡා කිරීම, සුවිශේෂී දුක්ගැනවිලි සාමූහිකව හඳුනාගැනීම සහ යෝජිත යාන්ත්‍රණය යටතේ ඔවුන්ගේම ගැටළු සහගත ක්ෂේත්‍රයන් පුමුඛතා ගත කිරීම සිදුවිය.

2. සුවවීමේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට කාන්තාවන්ගේ රැස්වීම්: සෑම දිස්ත්‍රික්කයකම කොන් කිරීමට ලක්වූ කාන්තාවෝ ඔවුන්ගේ ප්‍රජාවන් තුළ කාන්තාවන්ට වඩාත්ම බරපතළ ලෙස බලපාන ගැටළු සාකච්ඡා කර, මෙම ගැටළු ආමන්ත්‍රණය කිරීමට සහ පුද්ගලික, ප්‍රජා සහ ජාතික මට්ටමේ සුවවීම ශක්තිමත් කිරීමට මුලපිරීම් සැළසුම් කළහ.

3. සුව වීමේ ක්‍රියාකාරකම්: දුක් ගැනවිලි ආමන්ත්‍රණය කිරීමට, ඔවුන්ගේ අයිතීන් සඳහා කේවල් කිරීමට සහ සමාජයීය සහ දේශපාලන ගැටළු ගැන සංවාදය වැඩිකිරීමට, සිවිල් සමාජය, පළාත් ආණ්ඩුව, ආගමික පූජ්‍ය පක්ෂය, සහ ප්‍රජානායකයින්ගේ සහාය ඇතිව සෑම දිස්ත්‍රික්කයකම කාන්තාවන් නායකත්වය දරන මුලපිරීම්.

4. හුවමාරු චාරිකා: උතුර- දකුණ,දකුණ-නැගනෙහිර, නැගෙනහිර-මධ්‍යම සහ මධ්‍යම-උතුර යන පෙදෙස් අතර ඉගෙනීම, සාකච්ඡා සහ හුවමාරු කර ගැනීම් තුළින් පළාත් හරහා කාන්තාවන්ගේ ජාල වර්ධනය කිරීම, කතාන්දර, අත්දැකීම් සහ උගත් පාඩම් හරහා අන්‍යොන්‍ය බලගැන්වීම ශක්තිමත් කිරීම සහ ගැටුම නිසා බෙදී ගිය කණ්ඩායම් අතර අවබෝධය ශක්තිමත් කර සුවවීම සහ ප්‍රතිසංස්කරණය තුළ සහයෝගිත්ව සහභාගිත්වය වෙත යොමුවීම.

2016 දෙසැම්බර් මස, මෙම ක්‍රියාකාරකම් අතුරතුර මතුවූ අවධානය යොමුකළ යුතු ගැටළු සම්පිණ්ඩනය කර, ප්‍රජානායකයින්, ආගමික නායකයින්, සිවිල් සමාජ සංවිධාන, රාජ්‍ය තාන්ත්‍රිකයින්, මූල්‍යාධාර සපයන්නන්, රාජ්‍ය සේවක පිරිස් සහ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියෙහි සිටින දේශපාලන නායකයින් හට ක්‍රියාත්මක වීම සඳහා විශේෂිත ඇමතුමක් ලෙස කාන්තා ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ඉදිරිපත් කරනු ලැබේ.

යුද්ධයෙහි දෛනික ප්‍රචණ්ඩත්වයන් හරහා නිශ්ශබ්ද කර තිබූ කාන්තාවන්ගේ හඬවල් පුළුල් පරාසයක ගැටළු ගැන මතු කිරීමට බෙහෙවින් අවශ්‍ය වූ අවස්ථාවක් මෙම ක්‍රියාකාරකම් තුළින් නිර්මාණය කර දී ඇත. ඔවුන්ගේ පුද්ගලික අත්දැකීම්වලින් මෙම රටෙහි සාමය, ප්‍රජාතන්ත්‍රවාදය සහ යුක්තියට ඇති අභියෝග හඳුනාගෙන, ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසිභාවය තුළ ඔවුහු කාන්තාවන් ලෙස සහභාගි වන ක්‍රම ඉස්මතු කර දක්වති. මෙම ව්‍යාපෘතියෙහි පාඩම් දිස්ත්‍රික්ක 9 කින් පමණක් වන අතර, එය පූර්ණව පුළුල් වීම සඳහා තවදුරටත් අධ්‍යයනය කිරීම අවශ්‍ය වන අතර, ඒවා පශ්චාත් යුද ශ්‍රී ලංකාව තුළ කාන්තාවන්ගේ අභියෝග සහ අත්දැකීම්වල වැදගත් කථා වස්තුවක් ලෙස පවතී. තවද, එය ජාතියෙහි සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලිය අතරතුර කාන්තා පුරවැසියන්ගේ ඉල්ලීම් නියෝජනය කරයි.

## දේශපාලන ප්‍රචණ්ඩත්ව ක්‍රියාකාරිත්වයන් සඳහා යුක්තිය

ශ්‍රී ලංකාව බෙදීම්, ප්‍රචණ්ඩත්වයන් සහ අයුක්තිය යන මේවායේ ඉතිහාසයකින් බර වී ඇත. 1950 ගණන්වල ජනවාර්ගික කෝලාහාල වලින් පසු ශ්‍රී ලාංකීය ජනතාව දේශපාලන ප්‍රචණ්ඩත්වයට බෙහෙවින් හුරුපුරුදු වී සිටිති. ඒවා ඔවුන්ගේ ජීවිත, ඔවුන්ගේ පවුල්, ඔවුන්ගේ ප්‍රජාවන් සහ ඔවුන්ගේ ජාතිය පුපුරවා හැර ඇත. අපගේ ගැටුමෙහි බලපෑම අතිශයෝක්තියට ලක් කිරීම අපහසු වේ. මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර, පැහැර ගැනීම්, අතුරුදහන් වීම්, වධහිංසා, ස්ත්‍රී දූෂණ, නීතිවිරෝධී ඝාතන, බලෙන් අවතැන්වීම, සහ ළමා සොල්දාදුවන් බඳවා ගැනීම යන මේවා අතර තිබුණු අස්ථිර ජීවිතයක් තුළමෙම කාලයෙහි පැවති ප්‍රචණ්ඩත්ව තත්ත්වය සංකේතවත් කෙරුණු අතර, යුද්ධයෙහි අවසාන මාස කිහිපය තුළ අහිංසක සිවිල් වැසියෝ දස දහස් ගණනක් අයුතු අන්දමින් මරණයට පත්වූහ. මෙම ප්‍රචණ්ඩ ඉතිහාසයෙන් ආපසු නැගීසිටීමට නම්, මෙම වේදනාකාරී අතීතය ප්‍රශ්න කිරීමේ දුෂ්කර කාර්යය සිදුකිරීමට අපි කැමති විය යුත්තෙමු. ප්‍රචණ්ඩත්වයට ලක්වූ වින්දිතයින් සමග අව්‍යාජ ගණුදෙනුවකට ඇතුළු වී, ඔවුන්ගේ වේදනාව විශ්වාස කර, යුද්ධයේ නාමයෙන් සිදුකළ කෲරකම් පිළිගත යුතුය. තවද, අපගේ යුක්තිය, ආරක්ෂාව සහ ප්‍රජාතාන්ත්‍රික සංවාදය යන මේවායෙහි පද්ධතිවලට මෙම ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීමට ප්‍රමාණවත් ලෙස ඔරොත්තු දීමේ හැකියාව පවතිනබව තහවුරු කළ යුතුය. අපගේ රට, සහ අපගේ ජනතාව, නැවත වරක් ප්‍රචණ්ඩත්වය මගින් දෙකඩ නොකරන අනාගතයක් ගැන අප හට යුක්තිසහගතව බලාපොරොත්තු විය හැක්කේ එවිට පමණි.

ගැටුම්කාරී තත්ත්වයකින් සාමය කරා සංක්‍රාන්ති වන රටවල් වල න්‍යාය පත්‍රයෙහි, දේශපාලන ප්‍රචණ්ඩත්ව ක්‍රියාකාරිත්වයන් සඳහා යුක්තිය සැපයීම කේන්ද්‍රීය විය යුත්තේ මේ හේතුව නිසාය. යුක්තිය වින්දිතයින්ගේ ක්ෂණික අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන අතර, රාජ්‍යය ගොඩනැගීම සහ සංහිඳියා ක්‍රියාවලියන් නැවත ශක්තිමත් කිරීමද සිදුකරයි. එමනිසා එය පශ්චාත් යුදමය අවධියෙහි ස්ථාවරත්වය වැඩිකරයි. ශ්‍රී ලංකාවෙහි පශ්චාත් යුද නැගිටීම සඳහා ප්‍රමුඛතා ගත කර ඇති සංක්‍රාන්තික යුක්තිය විවිධ අන්තර් සම්බන්ධතා සහිත යාන්ත්‍රණ වලින් සමන්විත වේ. මේවා එක්ව, තනි පුද්ගල ප්‍රචණ්ඩ ක්‍රියාකාරිත්වයන් ආමන්ත්‍රණය කිරීම, නීතියේ ආධිපත්‍යය නැවත තහවුරු කිරීම, සහ ප්‍රචණ්ඩත්වයේ වින්දිතයින් සහ සමස්තයක් ලෙස මුළු රටටම සුවවීම සඳහා පහසුකම් සැපයීමද සිදුකරයි. අවංක චේතනාවෙන් කටයුතු කරන්නේ නම්, මෙම යාන්ත්‍රණ වලට ගැටුමෙහි මූලහේතූන් ආමන්ත්‍රණය කිරීමටද සහාය විය හැකි අතර, වඩාත් පුළුල් සමාජයීය සහ දේශපාලනික පරිවර්තනවලට දායක විය හැක. අපගේ ව්‍යාපෘතිය තුළ ප්‍රාදේශීය ප්‍රජාවන් සහ කොන්කිරීමට ලක්වූ කාන්තාවන් ශ්‍රී ලංකාවේ යෝජිත සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණ සාකච්ඡා කිරීමට රැස්වූහ. දේශපාලන ප්‍රචණ්ඩත්වයෙන් තනි පුද්ගලයින් ලෙස සහ සාමූහිකව යථා තත්ත්වයට පැමිණීමේ කොටසක් ලෙස, බිම් මට්ටමේ ප්‍රජාවන් යුක්තිය ගැන මෙනෙහි කරන අයුරු මෙම සාකච්ඡාවලින් පෙන්නුම් කරයි. සංක්‍රාන්තික යුක්තිය ගැන විවිධ කණ්ඩායම්වලට



1. "සැබෑ කරුණු භාරගැනීමක් සිදුවන්නේ නැත. පුරවැසියන් අවාසනාවන්ත සිදුවීම් විඳ ඇති බව රජය නොපිළිගනියි"

දමිළකාන්තාව, වවුනියාව

පවතින ගැටළු සමහරක්ද මෙම සාකච්ඡා හෙළිදරව් කරයි. තවද, ස්ථාවර සහ තිරසාර ප්‍රතිඵලයක් සහතික කිරීමට නම්, සැළසුම් අවධියේදී සැලකිල්ලට ගත යුතු, ශ්‍රී ලංකා-වේ ගැටුමට සුවිශේෂී වන අත්දැකීම් ඉස්මතු කර පෙන්වයි ග

## 1. සත්‍ය සෙවීම

මෙම ව්‍යාපෘතිය තුළ ඇතිවූ බිම් මට්ටමේ සාකච්ඡා වලින් ක්ෂණිකවම පැහැදිලි වුයේ, අතීතයෙහි සත්‍යය පිළිගැනීමට ඉක්මන් සහ හෘදයාංගම අවශ්‍යතාවක් ඇති බවයි.

දේශපාලනික ප්‍රචණ්ඩත්වයේ වින්දිතයින් හට, නිල වාරණය, හමුදාමය සුපරීක්ෂාව (ඔත්තු බැලීම්), සහ විපාක විඳීමේ තර්ජන හරහා ඔවුන්ගේ අත්දැකීම් සිතාමතාම නිශ්ශබ්ද කිරීමෙන් යටපත් කරන බව හැඟේ. බලහත්කාරයෙන් සිදුකළ අතුරුදහන්වීම්වල සිට යුද්ධයේ අවසාන දිනවල සිදුවූ පවුල් සාමාජිකයින්ගේ ප්‍රචණ්ඩ මරණ දක්වා පරාසයක වූ බොහෝ අතීත අත්දැකීම්වල පීඩනකාරී ස්වභාවය, සත්‍යය කථා කර මහත් වුවමනාවෙන් මුදහැරීමට බලාපොරොත්තු වන නොනැසී පවතින වේදනාවක තියුණු හැඟීම් දරාගැනීමට වින්දිතයින් හට බලකරයි. ඔවුන්ගේ අත්දැකීම්වල සත්‍යය විස්තර කිරීමට, මෙම සත්‍යය අව්‍යාජව ඇසීමට සහ පිළිගැනීමට සහ අතීතය නිල වශයෙන් ගණන් ගැනීම සඳහා වාර්තාගත කිරීමට සැළසීමෙන් වින්දිතයින් යථා තත්ත්වයට පත්විමේ වැදගත් භූමිකාවක් ඉටුකරයි: එය ඔවුන්ට සාක්ෂි දීමට ඉඩ සලසයි. ඔවුනට යම් විමුක්තියක් සපයයි, සහ අම්පාරෙන් පැමිණි කාන්තාවක් ප්‍රකාශ කළ පරිදි එය ඔවුන්ගේ මනුෂ්‍යත්වය පිළිබඳ හැඟීම ආපසු ලබාගැනීමට ඉඩ සලසයි.

අවාසනාවකට මෙන් වත්මන් කාලයේදී දේශපාලන ප්‍රචණ්ඩත්ව වින්දිතයින් හට හැඟෙන්නේ ඔවුන් දිගින් දිගටම නිශ්ශබ්ද කිරීමට සහ ඇහුම්කන් නොදීමට ලක්වන බවයි. සුළු ජාතිකයින් හට යුක්තිය ස්ථාපිත කිරීමට ගන්නා නිල උත්සාහයන් සැබෑ ලෙස අගය කිරීමට ලක්වන අතර, වින්දිතයෝ ඔවුන්ගේ අත්දැකීම්වල සත්‍යය සහ අතීත ප්‍රචණ්ඩත්ව ගැන ඇති නිල තත්වය අතර දිගින් දිගටම පවතින විෂමතාවන් ගැන බිය වෙති.
වගකීමෙන් යුතුවීම, වින්දිතයින් සහ රජය අතර විශ්වාසය නැවත ඇතිකිරීම සඳහා

> **"රජය එක දෙයක් පවසයි. මිනිස්සු වෙන දෙයක් කියති. මෙය එක දෙයක් විය යුතුය."**
>
> **– දමිළ කාන්තාව, මන්නාරම**

ප්‍රධාන වේ. තවද නව තන්ත්‍රය පැරණි තන්ත්‍රයෙන් අවංකවම වෙනස් බව පෙන්වීමට ධෛර්යය ඇතිබව පුරවැසියන් හට එමගින් සහතික කෙරේ. එමෙන්ම, අතීතයෙහි ප්‍රජාවන් භේද කළ බිය සහ අවිශ්වාසය මැඩපැවැත්වීමට වෙහෙස මහන්සි වීම සඳහා කැපවීම තිබිය යුතුය. මෙය පහසු නොවේ. නිදසුනක් ලෙස, "ඇසීමට ලක්වීමේ" සංකල්පය වුවද, අසමානාත්මතාවය පිළිබඳ හැඟීමක් ඇතිකරයි. ව්‍යාපෘතිය තුළ, රජය සිංහලයින් හට වැඩියෙන් ප්‍රතිචාරාත්මක වන බව සුළුතරයින්ට හැඟුණු අතර, සිංහලයින් ප්‍රකාශ කළේ සුළුතරයින් සිවිල් සමාජයෙන් සහ ජාත්‍යන්තර ප්‍රජාවෙන් වැඩි අවධානයක් ලබන බවයි. එබැවින් ශ්‍රී ලංකාව සඳහා වූ අව්‍යාජ සත්‍ය කොමිසමක්හට, ප්‍රවේශම් වීමට මෙන්ම, සාධාරණ, සියළු අත්දැකීම් වලට සුජාත බව සපයන, ප්‍රජාවන් අතර ප්‍රසිද්ධ සංවාදයකට අනුබල දෙන, සහ විවෘතව කරුණු බෙදාහදා ගන්නා දේශපාලනික අධිෂ්ඨානයක් තිබිය යුතුය. මේ මගින් අතීතය ගැන ඒකාබද්ධ අවබෝධයක් නිර්මාණය කිරීමට රටට හැකිවේ.

සාක්ෂි වැදගත් වන්නේ මෙහිදීය. සංක්‍රාන්තික යුක්තියෙහි කටයුතු කෙරෙන අතරතුර, නිවැරදි, අපක්ෂපාති දත්ත (ප්‍රමාණාත්මක සහ ගුණාත්මක) පුළුල්ව ප්‍රසිද්ධියට පත් කිරීමෙහි ඇති අවශ්‍යතාව ව්‍යාපෘතිය තුළ සිංහල, දමිළ සහ මුස්ලිම් ප්‍රජාවන් එක සමානව අවධාරණය කලහ. ඔවුන්ට හැඟුණේ මෙම දත්ත රට හරහාම "ස්වාධීන කොමිසමක් හරහා" (හම්බන්තොට) එක්රැස් කර "සාක්ෂි සහිතව" මහජනතාවට ලබාදී (ගාල්ල), "සාධාරණ අන්දමකින් සමානව සියල්ලන්ට ඇහුම්කන්දීමට" පුරවැසියන් හට ඉඩ හැරිය යුතුයි (මන්නාරම). ව්‍යාපෘතියට සහභාගිවූවන් අතර, සාධක මත පදනම් වූ සාක්ෂි දීමක අවශ්‍යතාව ගැන සුළු ජාතීහු අතිශයින් සැළකිලිමත් වූහ. ඔවුන්ගේ දේපොළ අහිමිවීම, සහ දේශපාලන ප්‍රචණ්ඩත්ව සිද්ධීන්, නිල වශයෙන් ලේඛන ගත කර ප්‍රසිද්ධව බෙදාහැරිය යුතු බවට ඔවුහු උත්සුක වූහ. මෙම තොරතුරු එක්රැස් කිරීමට ඔවුහු ග්‍රාම සේවක සමග වැඩ කිරීමට උනන්දු වෙති. බලපෑමට ලක්වූ ප්‍රජාවන් සහ රජය අතර වග වන සහ සමගි සන්ධාන සබඳතා ගොඩනැගීමට කාන්තා කණ්ඩායම් සංවිධානය වීමට කැමති වී ඇත. ඔවුන් විශ්වාස කරන්නේ, මෙම කටයුතු දැන් ආරම්භ කළහොත්, කාලය පැමිණි විට ඵලදායීව සහ කාවදින අයුරින් සාක්ෂි දීමට ඔවුහු සූදානම් වෙති.

සත්‍යය සෙවීම තුළින් සිංහල කණ්ඩායම් අමනාප කර ගැනීමක් වේ යැයි විශ්වාස කරමින් නිල කටයුතුවල යම් දෙගිඩියාවක් තිබුණත්, අප ව්‍යාපෘතියේ සිංහල සහභාගිවූවන් අතර සුළු ජාතීන්ට ඇහුම්කන් දීමේ අවංක අවශ්‍යතාවයක් ඇතිබවට සාක්ෂි තිබීම ධෛර්යයට හේතුවකි. මුලදී යුද්ධය ගැන ඔවුන්ගේම දෘෂ්ඨි කෝණයන් සමග ව්‍යාපෘතියට පැමිණි අතර, ප්‍රජාවන් අතර විවෘත අන්තර් ක්‍රියා මගින් උනන්දුවීම් රාශියක් සහ කරුණාව ඇතිවී,ප්‍රචණ්ඩත්වයෙන් සහ අයුක්තියෙන් සුළු ජාතීන් විෂමානුපාතිකව දුක්විඳ ඇති බව පිළිගැනීමට ඔවුහු යොමුවූහ. මරණයට පත්වූ හෝ අතුරුදහන් වූ සැමියන් හෝ දරුවන් අහිමිවීම් ගැන කතාන්තර බෙදාහදා ගැනීම විශේෂයෙන් ප්‍රබල විය. එය කාන්තාවන් හට ජනවාර්ගික බෙදීම හරහා එකිනෙකා සමග සහකම්පනය පෙන්වීමට, අතීත වැරදි පිළිගැනීම තුළ අන්‍යෝන්‍ය දුක බෙදාහදා ගැනීමට, සහ සත්‍යය පාදක කරගත් සාමය ගොඩගැනීමෙහිලා එකමුතුකම වර්ධනය කිරීමට අවකාශය විවෘත කර දෙන ලදී. අප ව්‍යාපෘතියේ මෙම අත්දැකීම් පාදක කරගෙන, සංක්‍රාන්තික යුක්තියෙහි සාර්ථකත්වය සඳහා මහජනතාව පුළුල්ව සම්බන්ධ කර ගැනීම සහ දැනුවත් කිරීම තීරණාත්මක බව අපි විශ්වාස කරමු. අපගේ

අත්දැකීමෙන් පෙනෙන්නේ, අව්‍යාජ සංවාදයක් සඳහා වේදිකාවක් ඇතිවිට ප්‍රජාවන් ඔවුන්ගේ මුල් විරුද්ධකම් මැඩපවත්වා ගැනීමට ඉක්මන් වන බව සහ එක් එක් පාර්ශවයෙහි පුද්ගලික කතාන්දර බෙද-ාහදා ගන්නා විට, ඔවුන්ගේ සහකම්පන (සංවේදී) සබඳතා ශක්තිමත්ව වර්ධනය වන බවයි.

"අතීතය අමතක කර ඉදිරියට යාම වඩාත් හොඳය" යනුවෙන් මන්නාරමේ සිංහල කාන්තාවක් කළ ප්‍රකාශ-යට ප්‍රතිචාර වශයෙන් දමිළ කාන්තාවක් කඳුළු පිරි දෙනෙතින් ඇගේ කතාන්දරය මතක් කළාය. ඇය ඇගේ පුතා සන්නද්ධ හමුදාවලට භාර දුන්නේ පසුදින ඔහුව ආපසු එවීමේ පොරොන්දුව මතය. නමුත් තවමත් ඇයගේ පුතා ඇයට ලැබී නැත. තවද ඇය ඇගේ වයස අවුරුදු 25 ක් වූ අතුරුදහන් කළ දෙ-වැනි පුත්‍රයාගේ සිද්ධිය විස්තර කළාය. ඇගේ පුත්‍රයා ඔහුගේ යතුරුපැදිය නාවුක හුමදාවට දීමට ප්‍රතික්ෂේප කළේය. මෙම සිද්ධියෙන් පසු ඔහුව ඔහුගේ නිවසි-න් රැගෙන යන ලදී. ඇය තවමත් ඔහුව සොයමින් සිටින්නීය. මෙම කතාන්දරය අසා සිටි, නුවරින් පැමිණි සිංහල කාන්තාවක් පැවසුවේ, "මෙය අතිශයින්ම අසාධාරණයිෟ අපේ පවුලේ එක් සාමාජිකයෙකු හෝ අතුරුදහන් කළා නම් මට ජීවිතයක් ගැන සිතන්නවත් බැහැ"යනුවෙනි.

"වින්දිතයින්ට සිදුවූයේ කුමක්දැයි දැනගැනීමට අපට අවශ්‍යයි. ඔවුන්ගේ ආගම හෝ සංස්කෘතික පසුබිම නොසළකා, මෙම මිනිසුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට සිදුවූයේ කුමක්දැයි අපි සෙවිය යුතු වෙමු. අපි සත්‍යය සෙවිය යුතු වෙමු. යුද්ධයෙන් සෘණාත්මක බලවයපෑම් ඇතිවූ පවුල්වලට යුක්තිය ලබාදිය යුතුයි. රජය විසින් ඔවුන්ට සහයෝගය ලබාදී ඵලදායී විසඳුමක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේගට□

ˆ සිංහල කණ්ඩායමේ මෙනෙහි කිරීම, හැටන්-

ණීඅපි එකිනෙකාට ආදරය කර, ගරු කර, අනුකම්පා-ාව දැක්වූයේ නම්, මෙය යුද්ධය ආරම්භ වීමට ඉඩ නොතිබිණ.

- සිංහල කාන්තාව, මහනුවර-

## 2. ශ්‍රී ලංකාවේ යුක්තිය සහ ආරක්ෂක ආයතනවල විශ්වසනීයත්වය

"මාධ්‍යය දිනපතාම සියළු ආකාරවල දූෂණ සිදුකර ඇති වැරදිකරුවන් පෙන්වන නමුත්, එය ප්‍රමාණවත් නොවේ! අපට අවශ්‍ය කරන්නේ ඔවුන්ට දඬුවම් කරන්නේ කෙ-සේද යන්න සහ ඔවුන්ගේ දූෂණ නිසා වින්දිතයින් වූවන්ට යුක්තිය ඉටුකිරීම දැකීමයිග"

ˆ සිංහල කාන්තාව, අම්පාර

ණීරාජ්‍ය සේවකයින් පත්කරන්නේ ජනතාවට සේවය කිරීමට බව අපි විශ්වාස කරන නමුත්, ඇත්තෙන්ම සිදුවන්නේ ඔවුන් ඔවුන්ටම සේවය කර ගැනීමයිග''

''දමිළ කාන්තාව, මහනුවර

අපගේ ව්‍යාපෘතිය අතරතුර, අපි යෝජිත සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලිය කාන්තාවන්, ආගමික නායකයින්, ප්‍රජා නායකයින් සහ ප්‍රජා සංවිධානවල සාමාජික-යින්ගෙන් සමන්විත ප්‍රාදේශීය ප්‍රජා සාමාජිකයින් සහ ප්‍රාදේශීය දේශපාලන නිලධාරීන් සමග සාකච්ඡා කළෙමු. මෙම කණ්ඩායම් සමග කළ සමීක්ෂණයකදී, දිස්ත්‍රික්ක නවයෙන් සයක්ම ඉතාමත් වැදගත් සංක්‍රා-න්ති යුක්ති යාන්ත්‍රණයන් දෙක ලෙස ශ්‍රේණිගත කර තිබුණේ යුක්තිය (සාපරාධී නඩු පැවරීමේ ආකාරයෙ-න්), සහ ආයතනික ප්‍රතිසංස්කරණයයි. මීට වෙනස්ව ගාල්ල සහ මහනුවර යුක්තිය සහ සත්‍යය ප්‍රකාශ කිරීම ප්‍රමුඛතා ගත කර තිබූ අතර, වවුනියා දිස්ත්‍රික්කය යුක්තිය සහ වන්දි ගෙවීම ප්‍රමුඛතා ගත කර තිබුණි. ශ්‍රී ලංකාව සඳහා ප්‍රධාන ප්‍රමුඛතාවන් අතර යුක්තිය ස්ථා-වරව ශ්‍රේණිගත කිරීමෙන් හඟවන්නේ සිංහල, දමිළ සහ මුස්ලිම් යන සියල්ලෝම නීතියේ ආධිපත්‍යයෙහි වටිනා-ාකම පිළිගන්නා බව සහ එය වහාම ක්‍රියාත්මක වන පරිදි භාවිතයේ යෙදවීම දැකීමට උනන්දු වන බවයි.

''එවකට පාසැල් ශිෂ්‍යයෙකු වූ මගේ දරුවා, පැහැර ගෙන ගොස් පවුල වෙත ආපසු ලබාදීමට පෙර දින තුනක් තුළ වධ හිංසාවලට ලක්කර තිබුණි. අපි කඳවුරුවල ජිවත්-වුණ අතර, යුද්ධයෙන් මට මගේ සැමියා අහිමි වුණා. හමුදාව විසින් මගේ ඉඩම ලබාගෙන ඇත. අපට මෙම අසාධාරණයන්ට එරෙහිව කතා කිරීමට බැරිවන්නේ ඔවුන් අපව බිය ගන්වන නිසයි. අප එසේ කළහොත්, අපට එහි ඵලවිපාක වලට මුහුණදීමට සිදුවේවිග"

- මුස්ලිම් කාන්තාව, අම්පාර





**''සාමාන්‍යයෙන් මිනිසුන් යුක්තිය සෙවීමට උත්සාහ කරන විට ඔවුහු අයුක්තිය අත්දකිති. බූස්ස හමුදා කඳවුර තුළ මිනිසුන්ට හිංසා දෙන ලදී. යුක්තිය වෙනුවෙන් සටන් කළ කාන්තාවෝ හමුදාවෙන් හෝ පොලිසියෙන් මානසිකව හෝ ශාරීරිකව දුක් වින්දාහ. අතුරුදහන් වීම් වලට පිළිතුරු සෙවීමට අවශ්‍ය වූ මිනිසුන්ට හමුදාවෙන්, පොලිසියෙන් හෝ ත්‍රස්ත විමර්ශන ඒකකයෙන් දුක් විඳීමට සිදුවිය. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමෙන් ඉදිරිපත් කළ වැඩවල ගුණාත්මකභාවය ප්‍රශ්න කළ අය දුක් වින්දහ.හමුදා කඳවුරුවල සහ පොලිස් ස්ථානවල අත්අඩංගුවට ගත් මිනිසුන්ට වධහිංසා දී අපයෝජනයට ලක්විය.''**

**ෟ කණ්ඩායම් මෙනෙහි කිරීම, අම්පාර**

2015 දී නව රජයක් පත්කර ගැනීම පිරිසිදු පාලනය සහ නීතියේ ආධිපත්‍යයට ඉක්මණින් ආපසු හැරීමේ පොරොන්දුව මත පදනම් විය. මෙය මිනිසුන් තුළ විශාල බලාපොරොත්තු ඇතිකළ අතර, එයම ප්‍රජාතන්ත්‍රවාදයට සහ ප්‍රතිසංස්කරණයට දිගුකාලීනව පරිවර්තනය වීම සඳහා ප්‍රබල උත්තේජනයක් විය හැක. අවාසනාවකට මෙන්, ඉහත සඳහන් ප්‍රකාශ වලින් පෙන්වන අන්දමට, පුරවැසියෝ නැවත වරක් ශ්‍රී ලංකාවේ යුක්තියෙහි පද්ධතිය ගැන තැබූ විශ්වාසය බිඳ වැටීමට පටන්ගෙන ඇත. තවද, සුළු ජාතීන් අතර, ශ්‍රී ලංකාවේ ආරක්ෂක ආයතන ගැන විශ්වාස කටයුතු බියක් දිගටම පවතී. යුද්ධය මගින් කෙලසන ලදුව සහ හිටපු රාජ්‍ය තන්ත්‍රයේ බලපෑමට ලක්ව, අධිකරණය සහ පොලීසිය දූෂණ, ඥාති සංග්‍රහය, අල්ලස් සහ අසමානාත්මතාවය යන මේවායේ මඩවගුරක එරී ඇත. සියළුම දිස්ත්‍රික්කවලින් සහභාගිවුවෝ යුක්තියෙහි අසාමාන්‍ය මන්දගාමී ක්‍රියාවලියට සාක්ෂි දැරූහ. බොහෝවිට අහිංසකයින්ට දඬුවම් පමුණුවා, වැරදි කරුවන් නිතරම නිදහස් කරන බව ප්‍රකාශ කරමින් අධිකරණය සත්‍ය වශයෙන්ම යුක්තිය ඉෂ්ඨ කරන්නේදැයි ඔවුහු සැක පළ කළහ. මේ අනුව, යුක්තියෙහි පද්ධතිය මිනිසුන්ට සේවය කරන්නේවත්, නීතියේ ආධිපත්‍යය බලාත්මක කරන්නේවත් නොමැති බව, ඔවුහු විශ්වාස කළහ. රජය සිය මැතිවරණයට කලින් ප්‍රකාශ කළ වෙනස්වීම් සම්භාරය ප්‍රබලව දිගටම ගොඩනැගීම සඳහා, යුක්තියෙහි මූලධර්ම අනුව කටයුතු කිරීමට එහි උත්සාහයන් වෙත ආපසු යාම රජය විසින් ඉතා ඉක්මණින් කළ යුතුය.

දමිළ සහ මුස්ලිම් ජනතාවට, මෙම උත්සාහය ඔවුන් මුහුණදෙන බියගැන්වීම් සහ දේශපාලනමය වශයෙන් කෙරෙන කොන්කිරීම් අඩු කිරීමට ගන්නා අවංක පියවරවල් සමග එකට යා යුතුය. මේ අනුව, ඔවුන්ට රජය සමග විශ්වාසවන්ත සම්බන්ධතාවක් වර්ධනය කිරීම ආරම්භ කිරීමට හැකිවනු ඇත. යුද්ධයෙන් පසු පොලීසියෙහි සහ හමුදා නිලධාරීන්ගේ විනීත බව වැඩිදියුණු වී ඇති බව පෙන්වන බොහෝ සිද්ධීන් සුළු ජාතී සහභාගිවූවන් බෙදාහදා ගත් අතර, උතුරෙහි සහ නැගෙනහිර ආරක්ෂක හමුදාවලින් තවමත් තර්ජන, ඔත්තු බැලීම්, ප්‍රශ්න කිරීම් සහ හිරිහැර කිරීම් වල සිත් සසල කරන වාර්තා ඇත. හමුදාව විසින් නොනවත්වා කෙරෙන ඉඩම් අල්ලා ගැනීම්වලින් නීතිය යටතේ සුළු ජාතීන් හට පවතින අසමාන තත්ත්වය තවදුරටත් සවි ගන්වයි. මෙය, යුක්තිය නැවත පිහිටුවීම ගැන රජය දෙන පණිවුඩයට සෘජුවම පරස්පර විරෝධී වේ. මෙම වෙනස්කොට සැළකීම දිගටම පැවතුනහොත්, සුළු ජාතී වින්දිතයින් සහ රජය අතර සුජාත කළ විශ්වාසය නොමැතිකමක් මගින් සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියට බාධා පමුණුවයි.

## 3. අතුරුදහන් වූ පුද්ගලයින්

**''මගේ අතුරුදහන් වූ පුතා තයිපොංගල් දින රූපවාහිනී වැඩ සටහනක් තුළ මම දුටුවෙමි. මම නීතිඥයෙක් මගින් අධිකරණයට ගිය නමුත්, සිද්ධීන් සතරකදී මට වෙනස් මිනිසුන් සතර දෙනෙක් පෙන්වන ලදී. එබැවින් මම නාවුක කඳවුරට ගියෙමි. මගේ ගෙදරට විත් මගේ පුතා ගෙන ගියේ එම කඳවුරේ මිනිසුන් විසිනි. ''මගේ පුතා දෙන්න'' යැයි මම ඔවුන්ට කීවෙමි. ''ඇතුළට එන්න. ඔබට පුතෙක් දීමට මට හැකියි. යනුවෙන් නාවික නිලධාරියා මා හට පැවසුවේය.''**

**-දමිළ කාන්තාව, මන්නාරම-**

**''මට වයස අවුරුදු 19 සහ 20ක් වන අතුරුදහන් වූ දියණියන් දෙදෙනෙක් සිටී. මම ඔවුන් සෙවීම සඳහා රජයේ නිලධාරියෙක් වෙත ගියෙමි. ණීමෙය අත්හැර දමන්න. ඔබේ ජීවිතය සමග දැන් ඉදිරියට යන්න. යම් ජීවනෝපායය සහායක් ලබාගන්න. යුද්ධයේදී, සුනාමියේදී, මියගිය බොහෝදෙනෙක් සිටිති; ඔවුන් සමග ඔබව සන්සන්දනය කරන්න. එමනිසා මෙය අත්හැර දමන්න.□ යනුවෙන් ඔහු මට පැවසීය. නමුත් අපි ඉල්ලා සිටින්නේ මරණයට පත්වූ හෝ ඝාතනය කළ අපේ දරුවන් නොව, අතුරුදහන් කළ අපේ දරුවන්වයි! අපේ දරුවන්, අපේ සැමියන් ශ්‍රී ලංකා හමුදාවට හෝ ඔවුන්ගේ කඳවුරුවලට අපි භාර දුනිමු. සමහරුන් අපේ ගෙවල් වලින් බලෙන් ගෙන ගිය අතර, ඔවුන්ව කවදාවත් ආපසු එව්වේ නැත! අපි ඉල්ලන්නේ මැරුණු කෙනෙක් නොව අතුරුදහන් වූවන් ආපසු දෙන ලෙසයි!!''**

**-දමිළ කාන්තාව, මන්නාරම-**

**''සිය සැමියා අහිමි වූ කාන්තාවක් හට, ඔහුට සිදුවූයේ කුමක්දැයි දැනගැනීමට අයිතියක් ඇත; ඔහු ජීවතුන් අතර සිටී නම් ඒ කොහේද සහ මොන හේතුවක් සහ තත්ත්ව යටතේ ඔහුව රඳවා තබාගෙන සිටින්නේද ? ඔහු ජීවතුන් අතර නොමැති නම්, සිදුවූ දේ ගැන පහදා දීමක්, එසේ සිදුවූයේ මන්ද සහ කෙසේද යන්න ගැන. මෙම තොරතුරු පවතින අරගලයට උදව් කර අනාගතය කරා ඉදිරියට යාමට සහාය වේ. එවිට තමා වැන්දඹුවක්ද, නැද්ද යනුවෙන් තම අනන්‍යතාවය ඇය දැනගනී. ඇයට ලැබිය යුත්තේ වන්දි ගෙවීමක්ද, නැතහොත් යුක්තියද යන්න ඇය දැනගනී''**

**-දමිළකාන්තාව - වවුනියාව-**

ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියෙහි ඉතාමත් ඉක්මන් ප්‍රතිපාදනය වන්නේ අතුරුදහන් වූ පුද්ගලයින් සෙවීමය. සිවිල් යුද්ධය පැවතුන කාලයේදී පුද්ගලයින් 65,000 ක් පමණ අතුරුදහන් වී ඇති බවට ගණන් බලා ඇත. මෑතකදී පිහිටුවන ලද අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳ කාර්යාලය විසින් මෙම සංඛ්‍යාව අඩුකෙරේ යැයි අදහස් කෙරේ. අපගේ ව්‍යාපෘතියට සහභාගි වූ කාන්තාවන්ගේ කතාන්දර වලින් පෙන්නුම් කරන පරිදි, ආදරණීයයෙක් අතුරුදහන් වීමේ මුල් බිහිසුණු අත්දැකීම, පිහිටක්







නොදෙන පද්ධතියක් තුළ ඔවුන් සෙවීමේ අමරු කාර්යය මගින් ද,නොදන්නා දෙයක පවතින අඩමාන තත්ත්වයක් දරා ගැනීම මගින් ද, තවත් උග්‍රවේග

එල්ටීටීඊය මගින් අතුරුදහන් කළ වූවන්ගේ ඉරණම විමර්ශනය කිරීම දැන් වඩාත් අපහසු වන අතර, රජයේ හමුදාවන් විසින් සිදුකළ බලහත්කාර අතුරුදහන්වීම් සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ කළ අත්අඩංගුවට ගැනීම් නිසා අතුරුදහන්වූ දහස් ගණන් සිටිති. අපගේ ව්‍යාපෘතිය තුළ, මෙම පුද්ගලයින් සොයා දෙන ලෙස හෝ අඩුම තරමේ, ඔවුන්ට අත්වූ ඉරණම් හෙළිදරව් කරන ලෙස නැවත නැවත බලාපොරොත්තු සුන්වූ ඉල්ලීම් කෙරුණි. අතීතයේ පැවති කොමිසම් වලට වඩා පුළුල් සහ වඩාත් ස්වාධීන වරමක් සහිත අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳ කාර්යාලයට, මෙම පවුල් වලට පූර්ණව සහ සංවේදීව ප්‍රතිචාර දැක්වීමට හැකි වේ යැයි ද, එය සේවය කිරීමට අපේක්ෂා කරන අය සමග කෙරෙන අව්‍යාජ අදහස් විමසීමක් සහිතව සිදුකෙරෙන කාර්යක්ෂම ක්‍රියාවලියක් පිහිටුවනු ඇතැයද, අපි බලාපොරොත්තු වෙමු.

අපගේ ව්‍යාපෘතියෙහි කාන්තාවෝ ඔවුන්ගේ සෙවීමට බාධා කරන පටිපාටිමය අභියෝග කිහිපයක් ඉස්මතු කළහ. අතුරුදහන් වූවන්ගේ කොමිසම සඳහා ක්ෂේත්‍රයෙහි පිහිටීමක් නොමැති වීම නිසා, කාන්තාවන් හට දැරිය නොහැකි කාලය සහ සම්පත් වැය කර, යම් ප්‍රවෘත්තියක් තිබිය හැකි තැන් සොයා රට හරහා ගමන් කිරීමට සිදුවේ. දරුවන් හෝ වැඩිහිටියන් රැකබලාගැනීමේ වගකීම් ඇති කාන්තාවන් හට මෙය විශේෂයෙන් අපහසු වේ. නිල ආයතන සමග සන්නිවේදන වුවද,කාන්තාවන් සිතෙහි තබාගෙන පිටපත් නොකෙරේ. තොරතුරු හෝ සහාය සඳහා කරන ඉල්ලීම් වලට ප්‍රතිචාර ඒවායේ පිටපත් යවන අනෙකුත් නිලධාරීන් සමග සන්නිවේදනය පහසුකිරීම පිණිස ඉංග්‍රීසි බසින් යවන නමුත්,

බොහෝ පවුල් වලට ඒවා කියවිය නොහැක. මේ මගින් අරගලය දිග්ගැස්සී, ක්‍රියාවලිය සමග තවදුරටත් කටයුතු කිරීමට පවුල්වලට ඇති අවස්ථාව නැතිකර, ලේඛනවල වැරදි ඇත්නම් ඒවා දැකබලා ගැනීමේ හැකියාව නැති කිරීම නිසා, සෙවීමට බාධා පැමිණිය හැක.

නිල ආයතනවලට යාමට පවුල් දැනට බියවන්නේ ඔවුන්ට ඔවුන්ගේ ආදරණීයයන් අතුරුදහන් වී ඇති බව ප්‍රතික්ෂේප කිරීමට බල කරන නිසාය. ත්‍රිකුණාමලය, මන්නාරම, වවුනියාව සහ කිලිනොච්චි වලින් පැමිණි කාන්තාවන් පැවසුවේ ඔවුන්ගේ අතුරුදහන් වූ දරුවන් හෝ සැමියන් සඳහා මරණ සහතික ලබාගන්නා ලෙස බල කරන ලද බවයි. ඔවුන් මරණ සහතික සඳහා ලිපිගොනු කිරීමට ප්‍රතික්ෂේප කළවිට පවා, සමහරුන්ට බල කරන ලදී. වන්දි වශයෙන් රුපියල් 100,000 ක් දීම ඔවුන් දකින්නේ ඔවුන්ගේ ආදරණීයයන් සෙවීම නැවැත්වීමට රජයෙන් දෙන අල්ලසක් ලෙසයි. මන්දයත්, පුද්ගලයෙකු අතුරුදහන් වූ සිද්ධියකදී මරණ සහතිකයක් නිකුත් කිරීම සත්‍යය ප්‍රතික්ෂේප කිරීමකි. මෙය මෙම දිස්ත්‍රික්කවල දමිළ සහ සිංහල කාන්තාවන් දෙපක්ෂයටම සිදුවී ඇත. මිනිසුන් අතුරුදහන් කිරීමට යුධ හමුදාව සම්බන්ධ වන විට අමතර පීඩනයක් ඇතිවේ. පොලීසිය මෙම පවුල් වෙත ගොස්, එම සිද්ධිය මරණයක් ලෙස හෝ නොදන්නා පුද්ගලයින් විසින් පැහැර ගැනීමක් ලෙස ලිපිගොනු ඉදිරිපත් කරන ලෙස ඉල්ලති. මෙහි ප්‍රතිපලයක් ලෙස, බොහෝ පවුල් ඔවුන්ගේ සෙවීම පූර්වව එහෙත් අනිවාර්යයෙන්ම අවසන් වේ යැයි සිතා පොලීසිය සමග කටයුතු කිරීමෙහි නියැලීමට බියවෙති.

මෙම බාධක මධ්‍යයේ වුවද, අතුරුදහන් වූ පුද්ගලයින්ගේ පවුල් සිය ආදරණීයයන් සෙවීම නොනැසෙන ධෛර්යයකින් සහ බලාපොරොත්තුවකින් නොනවත්වා කරගෙන යති.

"යුද්ධය අතරතුර මගේ සැමියා ඝාතනය කෙරුණි. මම මගේ දරුවන් දෙදෙනා, එනම් දියණිය සහ පුත්‍රයා සමග ජීවත්වූයෙමි. එක් දිනක් මගේ පුතා හමුදාවට භාරදෙන ලෙස ඉල්ලීම් කළෙන් මා විසින් ඔහු කැටුව ගොස් භාර දුනිමි. මම මගේ පුතාව අවසන් වරට දුටු අවසථාව එයයි. එදා පටන් හැකි සෑම තැනකටම, මගේ පුතා සිටීයැයි කියූ සෑම තැනකටම, මම ගියෙමි. වසර ගණනාවක් තුළ මගේ සැමියා සහ පුතා නොමැතිව මගේ ජීවිතය ගෙවුණේ ඉතා අපහසුවෙනි. මම අදාළ නිලධාරීන්ට පුතා ගැන අසා ලිපි යවා යුක්තිය සඳහා ඉල්ලුම් කළ නමුත්, මට කිසිම යහපත් ප්‍රතිචාරයක් ලැබී නැත. මෑතකදී මාධ්‍යය මගින් පෙන්වූ ඡායාරූපයක මගේ පුතා මම දුටුවෙමි. මම ඒ ඡායාරූපය ගැන තොරතුරු සොයා මගේ පුතා සොයාගැනීමට සහයෝගය දක්වතැයි සිතූ අදාල කණ්ඩායම් වෙත ලඟාවීමට උත්සාහ දැරුවෙමි. වත්මන් රජයෙන් සීමාකිරීම් නැති නිසා කොළඹට ගොස් මගේ පුතා ගැන සොයා බැලීම මට පහසු විය. කොළඹට යාමට මට උදව් කළ කණ්ඩායම මාව තමන්ගේ අතුරුදහන් වූ ඥාතීන් සොයන අන් අය සමග නවාතැන් දුන්හ. ප්‍රතිඵලය කුමක් වුවත් එයට මුහුණදීමට ඔවුන් සූදානමින් සිටියහ. (එම ඡායාරූපය) මගේ පුතාගේ බව සහ මට ඔහුව ආපසු ලැබෙන බවට මා තුළ ලොකු විශ්වාසයක් තිබුණි. මම බන්ධනාගාරයට යාමට පෙර ලොකු ආතතියකින් සිටියේ. වසර ගණනාවකට පසු මගේ පුතා දකින්නට ලැබේ යැයි මම සහතික කරගෙන සිටියෙමි. වසර ගණනක් පහුවුණත් මට මගේ පුතාව හඳුනාගත හැකියි."

"නමුත් බන්ධනාගාරයේදී මට පෙන්වුයේ මීට වසර 15 කට පෙර වයස අවුරුදු 21 දී අපරාධයක් කිරීමේ හේතුවෙන් එහි සිටි වයස අවුරු 35 ක් වූ මිනිසෙකුවයි. අපි දෙදෙනාම එක් එක්කෙනාව දුටු විට පුදුමයට පත්වුයෙමු. මගේ බලාපොරොත්තු සුන්වීම කොතරම් විශාල වුවත්, මම ධෛර්යය ගෙන මා ආ කාරණය ඔහුට තේරුම් කර දුනිමි. ඔහුගේ මව පැමිණ ඇතැයි කී විට ඔහු පුදුම වූ බව ඔහු පැවසීය. මන්දයත් ඔහුව බන්ධනාගාරයට රැගෙන ආපසු කිසිවෙක් ඔහුව බැහැදැකිමට නොපැමිණි නිසයි. ඔහු පැවසුවා "ඔබ මගේ අම්මා වුණා නම් මම කැමතියි" කියා. ඔහු මෙසේ පැවසූ විට මට එය බොහෝ සේ බලපෑවා. මට මොහොතකට මගේ පුතාව සම්පූර්ණයෙන්ම අමතක වූවා. මට ඔහුව නිදහස් කර ගැනීමට අවස්ථාවක් ලැබුණහොත් මා එසේ කරන බව මට හැඟී ගියා. සිරගෙදර වසර 15 ක් සිටීමෙන් පසු ඔහු කළ වරද ගැන අවශ්‍ය තරම් දුක්වන බව මට හැඟීගිය නිසා, මට උවමනා වුණේ ඔහුට ලෝකය තුළ නිදහසේ ජිවත්වීමටයි. මම වැඩි අධ්‍යාපනයක් ලබා නැති අතර, නීතිය ගැන දන්නේ නැහැ. එහෙත් තරුණ තැනැත්තෙකු වසර 15 ක් සිරගෙදර තබාගෙන සමාව දීමට සහ පුනරුත්ථාපනය කිරීමට බැරිව තබාගන්නේ මන්ද සහ කුමන නීතියකින්ද යන්න මම මගෙන්ම ප්‍රශ්න කළා. මාව ඒ ස්ථානයට කැටුව ගිය බලධාරීන්ගෙන් ද මා විමසුවා මෙම පිරිමි ළමයාව නිදහස් කළ හැකිද කියා. මගේ පුතා සොයන අතර, මට අවස්ථාවක් ලැබුණහොත් ඔහුව නිදහස් කිරීමට මඟක් සෙවීමට මම කැමැත්තෙමි

- දමිළකාන්තාව, මන්නාරම -

හානිපුරණ යනු දේශපාලන ප්‍රචණ්ඩත්වයේ වින්දිතයින් හට යුක්තිය නැවත ලබාදීමේ අන්තර් සම්බන්ධිත ක්‍රියාවලියක කොටසකි. ඔවුන් අත්දකින ලද සුවිශේෂී මානව හිමිකම් උල්ලංඝනය පිළිගැනීමත් සමග එය ලබාදේ. යුක්තියෙහි අව්‍යාජ ක්‍රියාවලියක් තුළ සිදුකරන විට, ඒවාට වින්දිතයින්ට පිළිගැනීම ලබාදී, ඔවුන්ගේ පුරවැසි බවේ අයිතීන් නැවත ලබාදීම, වින්දිතයින් සහ රජය අතර විශ්වාසය ප්‍රවර්ධනය කිරීම සහ සමාජීය එකමුතුකම වැඩි කිරීම කළ හැක. මූල්‍යමය වන්දි ගෙවීම හානිපුරණයෙහි එක් කොටසක් වන අතර, එය වින්දිතයා හට සිදුවූ අහිමිවීවල ප්‍රතිවිපාක සමනය කිරීමේ අදහසින් ලබාදේ. වන්දි ගෙවීම යුක්තියේ ක්‍රියාවලියෙහි කොටසක් බවට පත්වන්නේ එය නීතියෙහි ආධිපත්‍යය යටතේ ආරක්ෂාව යථා තත්ත්වයට පත්කරන අනෙක් පියවරවල් සමග යොදන විටය.

දැනට බිම් මට්ටමේ සිටින මිනිසුන්ට සංක්‍රාන්තික යුක්තියෙන් වන්දි ගෙවීම යනුවෙන් අදහස් කළ හැකි කුමක්දැයි යන්න ගැන විශාල ව්‍යාකූලතාවයක් පවතී. එය යුද්ධයේ සෘජු වින්දිතයින්ට පමණක්ද? නැතහොත් එය ස්වභාවික ආපදා, ආර්ථික පීඩන, හෝ අලි මිනිස් ගැටුම ආදියෙන් බලපෑමට ලක්වන අයව ආවරණය කරන්නේද? වන්දි ගෙවීම අතුරුදහන් වූ පුද්ගලයින්ගේ පවුල් වලට ක්‍රියාකරන්නේ කෙසේද? වන්දි පිළිගැනීමෙන් ඔවුන්ගේ සෙවීම සම්මුතියෙන් බේරා ගැනිමක් වේද? වන්දි සියළුම ජනවාර්ගික සහ ආගමික කණ්ඩායම් වලට ලබාදේ ද? වන්දි ගෙවීම මුස්ලිම් දේවස්ථාන සහ පන්සල් විනාශ කිරීම වැනි ප්‍රජා අහිමිවීම් ආවරණය කරන්නේද? නිදසුනක් ලෙස, නැවත විවාහ විය නොහැකි වැන්දඹුවකට වැනි ප්‍රමාණාත්මකව මැණිය නොහැකි අහිමිවීම්වලට වන්දි ගෙවීම ක්‍රියාකරන්නේ කෙසේද? වන්දි ගෙවීම, අහිමි වූ අවස්ථාවලට වඩා, අහිමිවූ දේපොළ නැවත ලබාදෙන්නේ නම්, එය පෙර පැවති අසමානාත්මතාවයන් නිවැරදි කරයිද? ප්‍රචණ්ඩත්වයෙහි පුළුල් බව (ව්‍යාප්තිය) සළකා බලන විට, වන්දි ලබාදීම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හානි කර වේදැ?

වන්දි ගෙවිමේ වැඩසටහන් කෙතරම් ඵලදායී වේ දැයි යන්න ගැන මිනිසුන් තුළ සැකයක් පවතී. වන්දි ලබාගැනීමේ අතීත අත්දැකීම් අවිධිමත් (නිදසුනක් ලෙස, "ලොතරැයි පද්ධතියක් මෙන් සිදුකරන ලද") දූෂිත ("අනිසි පක්ෂපාතීත්වයන්" හරහා හෝ පාලක පක්ෂයට සබඳතා ඇති අයට) අපරීක්ෂාකාරී ("සාවද්‍යය තොරතුරු" ගැන සොයා නොබලා බෙදා දුන්) වූ අතර, වෙනස්කොට සළකන ලද ඒවා විය.

"අපේ පවුල් සාමාජිකයින් 9 දෙනෙක් යුද්ධයේදී අපට අහිමි වූහ. අපි ද අවතැන් වීමු. දමිළ අය මෙන් අපට ද බලපෑම් ඇතිවිය. නමුත් අපට රජයෙන් ශතයක්වත් ලැබුණේ නැත."

- සිංහල කාන්තාව, මන්නාරම-

ව්‍යාපෘතිය හරහා නැවත නැවතත්, වන්දි ගෙවීම්වල සාධාරණත්වයක් නොමැති වීමෙන් සාමය ගොඩනැගීම කෙරෙහි ඇති ප්‍රගතිය කඩාකප්පල් කරයි යන්න ගැන සහභාගිවූවෝ ඔවුන්ගේ කණස්සල්ල බෙදාහදා ගත්හ. මෙය සිංහල මුස්ලිම් සහ දමිළ සහභාගී වූවන් එක සමානව බෙදාගත් බියකි. එය ගම්වල සම්බන්ධතාවලටද, වඩාත් පුළුල්ව ජාතික තලයෙහි ජනවාර්ගික සහ ආගමික කණ්ඩායම් අතර සම්බන්ධතාවලටද, බලපෑ හැකි බව ඔවුහු ප්‍රකාශ කළහ. දිස්ත්‍රික්ක හරහා සහභාගීවූවන් ප්‍රකාශ කළේ, යෝජිත සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණය තුළ වන්දි ගෙවිමේ වැඩසටහන බලපෑමට ලක් වූ සියල්ලන්හට සාධාරණ හා සමාන විය යුතු වන අතර, ශ්‍රී ලංකාවේ ජනවාර්ගික කණ්ඩායම් අතර නැවත වරක් ගැටුම් ඇති නොවීම තහවුරු කළයුතු බවයි.

අයුක්තිය තවදුරටත් පවතින විට, වන්දි ගෙවීම අර්ථ රහිත වන්නේ යැයි ඔවුන්ට හැඟුණි. නිදසුනක් වශයෙන්, උතුරෙහි සහ නැගෙනහිර හමුදාකරණය දිගටම පවතින බැවින් දමිළ සහ මුස්ලිම් ජනතාව දහස් ගණනින් අවතැන් වී ඔවුන්ගේ පාරම්පරික දේපොළ සහ ජීවනෝපාය මූලාශ්‍රයන් ඔවුන්ට අහිමිවී ඇත. වන්දි ගෙවීම සාකච්ඡාවට භාජනය කරන විට, සන්නද්ධ හමුදා අත්පත් කරගෙන ඇති ඉඩම් ආපසු ලබාදීම මුලික ප්‍රථම පියවරකි.

ඉඩම් දිගටම අල්ලා තබාගෙන හෝ ඒවා ලාභ ලබන ව්‍යවසායයන් සඳහා භාවිතා කරන අතරතුර, සුළු වන්දියක් ලබාදීම, මේ අනුව, යුක්තිය නොවේ. නමුත් එය යුක්තිය කඩාකප්පල් කිරීමකි. අතුරුදහන් වූවන්ගේ සිද්ධිය ගත්විට වන්දි ගෙවීම සංකීර්ණ බවට පත්වේ. මෙහිදී, වන්දි ගෙවීම ඔවුන් නොසිටීම නිසා සිදුකරන හානිපුරණයක් මිස, ඔවුන්ගේ මරණය සහතික කිරීමක් නොවන ලෙස දැකීම තහවුරු කිරීම පිණිස, අතුරුදහන් වූ ආදරණීයයන් සෙවිමට අව්‍යාජ ලෙස නියැලීම අවශ්‍ය වේ.

"අපට අවශ්‍ය වන්නේ වන්දි ගෙවීම නොවේ. අපට අවශ්‍ය ඔවුන් කොහේද කියා දැනගැනීමටය. විශේෂයෙන් ඕමන්තේ හිඳී භාර දුන් අය."

- දමිළකාන්තාව, මන්නාරම



මූල්‍ය වන්දි ගෙවීම අයුක්තියෙහි අර්ථවත් පිළිගැනීමක් ලබාදෙන අතර, දිගුකාලීනව යථා තත්ත්වයට පැමිණීමට උපකාර කරන හානිපූරණය සඳහා ඇති වඩාත් ඉක්මන් අවශ්‍යතාව ගැන සහභාගිවූවෝ ප්‍රකාශ කළහ. ඔවුන්ගේ දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීමට පවුල් අරගල කරන බැවින් අධ්‍යාපනය යථාතත්ත්වයට පත්කිරීම සහ ඒ සඳහා අවස්ථා ව්‍යාප්ත කිරීම මේවා අතර ප්‍රධාන වේ. කෙසේවෙතත්, සමහර තරුණ තරුණියන් හට වසර ගණනාවක් අධ්‍යාපනය බාධාවීමෙන් පසු නැවත පාසැල් යාමට ඔවුන්ට වයස වැඩිය. ඔවුන් සඳහා තාක්ෂණික පාසැල් වලට ප්‍රවේශය වැඩිකිරීම සහ හැකියාවන් ජනනය කිරීම වැදගත් වේ. යුද වැන්දඹුවන් සහ ගෘහමූලික කාන්තාවන් සඳහා නිර්මාණාත්මක ආදායම් උපැයීමේ අවස්ථා අවශ්‍ය කෙරේ. ඔවුනට තිරසාරව වෙළෙඳපොලට ඇතුල්වීමට උපකාර අවශ්‍ය වේ. සංවර්ධනය පදනම් කරගත් හානිපූරණය සඳහා අනෙකුත් යෝජනාවලට පොලී රහිත ණය ලබාදීම, නෛතික සහාය, සහ මූලික යටිතල පහසුකම් සංවර්ධනය සමග පුළුල් මානසික සෞඛ්‍ය සේවාවන් ලබාදීම අයත් විය.

**"ස්වයං රැකියා සමග, මිනිසුන්ට, ඔවුන්ගේම ජීවනෝපායය සකසා ගෙන, යුද්ධය අතරතුර සිදුවූ දේ අමතක කළ හැකිය."**

**- දමිල කාන්තාවක් ත්‍රිකුණාමලය**

**එය ක්‍රියාත්මක කෙරෙන බව සහතික කරන්න. මානසික රැකවරණය ලබාදෙන්නේ නම් සහ මිනිසුන් මානසිකව සුවවන්නේ නම්, ඔවුන් මුහුණ දුන් අනෙකුත් සියළු අහිමිවීම් ජය ගැනීමට ඔවුන්ට හැකි වේවි."**

**- කණ්ඩායම් මෙනෙහි කිරිම, මහනුවර**

**"ලබාදෙන වන්දිය හා ආරක්ෂාව කුමක් වුවත්, මට සහ මගේ දරුවන්ට මගේ සැමියාගෙන් ලැබුණු ආදරය සහ ආරක්ෂාව මේ ලෝකයේ කිසිම දෙයකින් ප්‍රතිස්ථාපනය (හිලව්) කළ නොහැක. අපි මැරෙන තුරු ඔහුගේ අඩුව අපට දැනේවී.**

**-සිංහල කාන්තාව, හම්බන්තොට**

බලපෑමට ලක්වූ පවුල්වල යහපැවැත්මට අර්ථවත් දායකත්වයක් සැපයීමට හානිපූරණවලට හැකිවිය හැකි අතර, අවසානයේදී ඔවුන් ශ්‍රී ලංකාවට සාමය ගෙන ඒම සඳහා පුළුල් ප්‍රයත්නයක කොටසක් විය යුතුය. එය අපගේ ගැටුමෙහි පිරිමැසිය නොහැකි බලපෑම සත්‍ය ලෙස පිළිගැනීම සමග ලබාදිය යුතුය.

දේශපාලන ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන් සඳහා යුක්තිය සාකච්ඡා කිරිමේදී ප්‍රචණ්ඩත්වය වෙන්ව පවතින ක්‍රියාවක් ලෙස අවශ්‍ය වශයෙන්ම ප්‍රත්‍යක්ෂ නොවිය හැකි බව සඳහන් කිරීම වැදගත්ය. දේශපාලන ප්‍රචණ්ඩත්වය පුරවැසිභාවයෙහි අයිතීන් සහ වරප්‍රසාද අහිමිකිරීම් වලට හේතුවන වෙනස්කොට සැළකීමේ අත්දැකීම් හරහා හඳුනාගත හැකිවේ.

ශ්‍රී ලාංකීය දමිළ සහ මුස්ලිම් ප්‍රජාවන්ට එරෙහි මේ ආකාරයේ දේශපාලන ප්‍රචණ්ඩත්ව ශ්‍රී ලංකාවේ බොහෝසෙයින් පිළිගන්නා අතර, ඉන්දියානු සම්භවයක් සහිත දමිළ ප්‍රජාවට එරෙහි දේශපාලන ප්‍රචණ්ඩත්වය දිගටම නොසළකා හැරේ. ඉන්දියානු සම්භවයක් සහිත දමිළ බහුතරය වතු අංශයේ සේවා නියුක්තියෙහි යෙදෙමින් වහල් බවට සමාන තත්ත්වයක රැඳී සිටිමින් දුර්වල රැකියා තත්ත්වයන්, ප්‍රමිතියකට නොමැති ජීවන තත්ත්වයන්, ඉඩම් නොමැතිකම දරා ගනිමින්, සහ සෞඛ්‍යය, අධ්‍යාපනය සහ අනෙකුත් අත්‍යවශ්‍ය සමාජ සේවාවන්ට අඩු ප්‍රවේශයක් සහිත වෙති. බොහෝ දෙනෙකුට පුරවැසිභාවයේ අයිතිවාසිකම් වලට ඇතුල්වීම සපයන මූලික ප්‍රලේඛන නොමැත. එහෙත් ඔවුන්ගේ ශ්‍රමය ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි සාර්ථකත්වයට සෘජුවම දායක වේ. ඔවුන්ගේ තත්ත්වය දේශපාලන ප්‍රචණ්ඩත්වයෙහි ප්‍රබල ආකාරයක් බව පිළිගැනීම, පුරවැසියන් ලෙස අවසාන කොට ඔවුන්ගේ අයිතීන් පිළිගැනීම සහ යථා තත්ත්වයට පැමිණවීම සාක්ෂාත් කිරීමට අවශ්‍ය කරන පූර්ව අවශ්‍යතාවයකි.

**"ඔබට ඉඩම් අයිතීන් තිබිය හැක. නමුත් අපට නොමැත. ඔබට වාසස්ථානයකට අයිතීන් තිබිය හැක. නමුත් අපට නෙ-**



ාමැත. අපව අනික් සමාජයන් පිළිගන්නේ නැත. ඔබට වැසිකිලි, කරාම, හොඳ පානීය ජලය, ඔබේ රැකියා ස්ථානයේ තිබිය හැක. නමුත් අප ආහාර ගන්නා විට වහිනවා නම් අපට වැහිවතුර සමග කෑමට සිදුවේ. උතුරෙහි සහ නැගෙනහිර මිනිසුන්ට ගැටළු පවතින්නේ යුද්ධය නිසාය. නමුත් අපි, අපව ශ්‍රී ලංකාවට රැගෙන ආ දා පටන් අපට ගැටළු පවතී.”

-ඉන්දියානු දමිළකාන්තාව, නුවරඑළිය-

1ග සත්‍ය සහ යුක්තිය සමග මහජන ගනුදෙනුව සඳහා විශ්වාසනීය සහ සේවා වෙත යොමු වූ ක්‍රමවේදයක් නිර්මාණය කරන්න

ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලිය සැලසුම් කිරීමේ ක්‍රියාවලියේදී මෙම යාන්ත්‍රණය විශ්වසනීය බවද, සියළුම ප්‍රජාවන් අතර විශ්වාසය වර්ධනය කරන සත්‍යය සහ යුක්තිය සෙවීමට මහජනතාව අවංකව නියැලීම සනාථ කිරීම ද, වැදගත් වේ. ක්‍රියාවලිය භාරව සිටින ප්‍රධාන නිලධාරීන්, විශේෂයෙන් සත්‍ය කොමිසමට නායකත්වය දෙන්නන්, මුලදීම මහජන විශ්වාසය දිනා ගැනීමට උත්සාහ දැරිය යුතුයි. ජාත්‍යන්තර සහභාගිත්වය වැනි මතභේදයට තුඩුදෙන ගැටළු සඳහා වුවද, මිනිසුන්ගේ අවබෝධයන් සහ ආකල්ප වෙනස්කිරීමට ඉඩ සළසමින්, මහජන අධ්‍යාපනය සහ දැනුවත් කිරීම වැදගත් වේ. (නිදසුනක් ලෙස, ගාල්ලේදී සිදුකළ සමීක්ෂණයේදී අපගේ සහභාගීවුවන්ගෙන් 85.7% ක් ඔවුහු දෙමුහුම් ඃයහඉරසා* අධිකරණයකට වඩාත් කැමති බව ප්‍රකාශ කළහ. සාක්ෂි ප්‍රසිද්ධ කිරීමද, මෙම භේදකාරී යුද්ධයෙන් පසු සමාජය තුළ පවතින බෑදීම වර්ධනය කර මිනිසුන්ට එකිනෙකාහට සහකම්පනය පෙන්වා සමාව දීමට ඉඩ සලසයි.

2ග ආරක්ෂාකාරී සහ ආගන්තුක සත්කාරයන් පිරුණු පරිසරයක් සැපයීමෙන් මහජන සහභාගිත්වය සහතික කරන්න

මහජනතාව සම්බන්ධ කර ගැනීමෙන් සහභාගිත්ව ක්‍රියාවලියද පහසු කෙරේ. මෙය විශේෂයෙන් ගැටුම නිසා අවදානමට ලක්වූ අය සඳහා සත්‍ය වේ. සාක්ෂිදෙන්නන් හට ආරක්ෂාව සනාථ කිරීම, නෛතික සහාය ලබාදීම, යුක්තිය සඳහා ඉක්මන් ප්‍රතිඵල ලබාගැනීමට පහසුකම් සැළසීම, මෙම නඩු විභාගවල විශ්වසනියත්වය ස්ථාපිත කිරීමට අත්‍යවශ්‍ය වේ. සත්‍ය කොමිසමෙහි මණ්ඩලවල, අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය සහ අනෙකුත් යාන්ත්‍රණවල, කාන්තා නියෝජනය වැදගත් වේ. එමෙන්ම ලිංගික සහ ස්ත්‍රි පුරුෂ සමාජභාවය පාදක කරගත් ප්‍රචණ්ඩත්ව ගැන සාක්ෂි දෙන කාන්තාවන් හට ආරක්ෂිත සහ සංවේදී පරිසරයක් සැපයීමද වැදගත් වේ. පවුල්වලට තොරතුරු සඳහා ඔවුන්ගේ අයිතිය තහවුරු කිරීමට සහ දිගටම පසු විපරම් කළ හැකි ලෙස සන්නිවේදනය දෙමළ බසින් සහ/හෝ සිංහල බසින් සිදුවිය යුතුය. තවද, දුර්වල සේවා, හිරිහැර කිරීම්, ආරක්ෂක හමුදා හෝ රාජ්‍ය නිලධාරීන් විසින් ඇති කරන පීඩනය සහ බියගැන්වීම වැනි අවස්ථා නිර්ණාමිකව වාර්තා කිරීමට පවුල්වලට ඉඩදීම වැදගත් වේ. එමෙන්ම පවුල්වලට උපද්‍රව පැමිණීමේ අවදානමක් නොමැතිව මෙම වාර්තා පසුවිපරම් කිරීමට හැකිවිය යුතුය.

3ග අතුරුදහන්වූවන් පිළිබඳ වූ කාර්යාලය

අතුරුදහන්වූවන් පිළිබඳ වූ කාර්යාලය ස්ථාපිත කර ඇති බැවින්, අප ව්‍යාපෘතියෙහි ප්‍රධාන සොයාගැනීම් කිහිපයක් ඇති අතර, ඒවා සැළකිල්ලට ගන්නේ නම්, අතුරුදහන්වූවන් පිළිබඳ නඩු විසඳීමේදී ඵලදායිත්වය වැඩිකර ගැනීමට ඉවහල් වේ. සත්‍ය වශයෙන් වඩාත් ඉක්මණින් කළ යුත්තේ, නඩු විභාගයකින් තොරව රඳවාගෙන සිටින්නන් නිදහස් කිරීමය. ඉතිරිව සිටින අය සෙවීමේදී, අතුරුදහන්වූවන්ගේ පවුල්වලට අතුරුදහන්වූවන් පිළිබඳ වූකාර්යාලය විසින් උපකාර කළ හැකි අමතර ක්‍රම පවතී. ක්ෂේත්‍රයෙහි පිහිටීමක් ස්ථාපිත කෙරේ නම්, දරා ගැනීමට නොහැකි අන්දමින් කාලය සහ සම්පත් වැය නොකර, පවුල්වලට වඩාත් පහසුවෙන් අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලයේ සේවාවන් ලබාගත හැකි වේ. අවසාන කොට, නොමග යවන මරණ සහතික වලට වඩා, අතුරුදහන් වූ තත්ත්වය දක්වන සහතිකයක් ලබාගැනීමට හැකිවීම, අතුරුදහන් වූ ආදරණීයයන් සෙවීම අනවශ්‍ය ලෙස නොනවත්වන බව තහවුරු කිරීමට වැදගත් වේ.

4ග හානිපූරණය සහ සමාජ සංවර්ධනය

යෝජිත සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණය යටතේ හානිපූරණයෙහි ස්වභාවය පැහැදිලි කිරීම කඩිනමින් කළ යුතුය. මූල්‍යමය වන්දි ගෙවීම් බලාපොරොත්තු වන අතර වන්දිගෙවීම් බෙදාහරින්නේ කෙසේදැයි නොදනී. තවද වන්දි ගෙවීම සාධාරණ වේ දැයි නොදනී. වන්දි ගෙවීම ගැන තිබෙන අවිනිශ්චිතතාව ගැන සළකා බැලු විට, එය ප්‍රවේශමෙන් නොකෙරේ නම්, සංහිඳියාව අඩාල කිරීමේ හැකියාව වැඩිය. යුද්ධයෙන් බලපෑමට ලක්වූ බොහෝ පවුල්වලට ඔවුන්ට විඳීමට සිදුවූ අහිමිවීම් මැඩපවත්වා ගැනීමට මූල්‍යමය උපකාර අවශ්‍ය වන අතර, දිගුකාලීනව යථාතත්ත්වයට යාමට අනුබල දීමේ හැකියාව ඇති බැවින් සමාජීය සහ ආර්ථික සංවර්ධන වැඩසටහන් හානිපූරණය ලෙසින් තිබීම අගය කරන බව පැහැදිළියග

5ග වන්දි සාධාරණව බෙදාදීම තහවුරු කිරීම

අධ්‍යාපනය, අලෙවි කළ හැකි කුසලතා, ආර්ථික ස්ථාවරත්වය, සහ බලපෑමට ලක්වූ පෙදෙස්වල යටිතල පහසුකම් සංවර්ධනය ස්ථාපිත කරන ව්‍යාපෘති සමගම, වන්දි වශයෙන් කරන ගෙවීම් සාධාරණව බෙදාදිය යුතුය. මනෝසමාජීයව යථා තත්ත්වයට පැමිණීම සඳහා පුළුල් වැඩසටහන් හානිපූරණය කෙරෙහි තීරණාත්මක වේ. සාධාරණ අන්දමින් සියළුම ප්‍රජාවන් (ඉන්දියානු සම්භවය සහිත දමිළ වැනි බොහෝ විට නොසළකා හරින කණ්ඩායම් ඇතුළුව) ඇතුළත් කරන, අධ්‍යාපනය සඳහා අහිමි වූ අවස්ථා නැවත ලබාදෙන, සහ දරිද්‍රතාවයෙන් සහ මනෝසමාජීය ආතතියෙන් යම් සහනයක් ලබාදෙන වැඩසටහන්, මෙම කාලයේදී ඉතා කඩිනමින් ඉල්ලු ඒවා විය.

6ග සිවිල් සමාජය සඳහා භූමිකාවක්

සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණ හරහා යුක්තිය සහ සාමය සුරක්ෂිත කිරීමේ කාර්යයේදී සිවිල් සමාජයට වටිනා භූමිකාවක් ඇත. ශ්‍රී ලංකාව තුළ පවතින විවිධ සිවිල් සමාජ කණ්ඩායම් වල පුළුල් විෂය පථය ගැන සළකා බලනවිට, සම්බන්ධීකරණය කළ ප්‍රයත්නයක් අවශ්‍ය වේ. කෙසේවෙතත්, මෙම ප්‍රයත්නයට තිරසාර ලාභාංශ තිබෙන බව පැහැදිළිය. අපගේ ව්‍යාපෘතිය අතරතුර, මෙම කණ්ඩායම් වෙතට යොමු වුයේ විශ්වසනීය සහ කාර්යක්ෂම නියෝජිතයින් ලෙසටය. ලිංගික ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීම හෝ අතුරුදහන්වූවන් සඳහා වගවීම වැනි අපහසු කාර්යයන් වලදී වුවද එසේ විය. ප්‍රථම පියවරක් වන්නේ, මච්චරුන්ගේ සංගම් වැනි ප්‍රාදේශිය කණ්ඩායම් වලට සහයෝගය දීමය. එනම්, ඔවුන්ගේ ප්‍රජාවන් සජීවීකරණය කිරීමට ඔවුන්ට ඉඩහැරීම, ප්‍රලේඛනය, සාක්ෂි දීම සහ අන්තර්ප්‍රජා සාමය ගොඩනැගීම, යන මේවාට සහයෝගය දීමය.

**Briefing Paper No- 3, December 2016**
**Published by: National Peace Council- 12/14 Purana Vihara road, Colombo 6, Sri Lanka.**
**Tel:+94 112 818 344, 0112 854 127 Fax: +94 112 819 064 Web: www.peace-srilanka.org**

**All rights reserved. Material from this publication maybe used with due credit to the National Peace Council.**

**Thanking Ms. Mariyahl M. Hoole for drafting the Briefing Paper.**

Supported by

FOKUS
FORUM FOR WOMEN AND DEVELOPMENT